# කවදත් අප සමග සිටින ඉන්දියාව




ඉන්දීය අගමැතිව සිටි ලාල් බහාදුර් ශාස්ත්‍රී මහතා සමග එකල ශ්‍රීලංකා අගමැති සිරිමා බණ්ඩාරනායක මැතිණිය



ශ්‍රීලංකාවට සුහද ගමනක් පැමිණි ඉන්දීය සුපිරි නළු අමිතාභ බච්චන් ශ්‍රීලංකා ජනාධිපතිතුමා හමුවූ අවස්ථාව. සිනමා නිළි ශ්‍රීලංකා රූප සුන්දරී ජැකොලයින් ෆර්ණනන්ඩිස් ද මෙයි වෙයි.




ඉන්දීය අගමැති ඉන්දිරා ගාන්ධි මහත්මිය සහ ලංකා අගමැති බණ්ඩාරනායක මහත්මිය හමුවූ කච්චතීවු දූපත ලංකාවට පැවරූයේ දිනය.

ඉන්දියාව සහ ශ්‍රීලංකාව දෙරට අතර සම්බන්ධය ඈත අතීතය දක්වාම දිවෙයි. මුල් යුග වලදී අප එදා ඉමහත් දායාදයන් භාරතයෙන් ලද අතර පසු කාලයේදී ඒවා මතම අපේ අනන්‍යතාවක් ගොඩනගා ගනිමින් වෙනම සංස්කෘතියක්, රටක් ජාතියක් වශයෙන් අප මුතුන්මිත්තෝ ලංකාව සැකැසූහ. මා මෙහිදී සාකච්ඡා කරන්නට අදහස් කරන්නේ එදා ගැන නොව බ්‍රිතාන්‍යයන්ගෙන් අප දෙරටම නිදහස ලබාගත් කාලයේදීත්, එයට පසුව අද දක්වා මෑත කාලයේත් පැවති සම්බන්ධතාවන් ගැනය.

## වාණිජමය සහ මූල්‍ය කටයුතු

පරිපාලනය සඳහා මේ දෙරට බ්‍රිතාන්‍යයන් විසින් වෙන වෙනම සලකනු ලැබූ අතර බොහෝ වාණිජමය කටයුතු සඳහා එක්කොට සලකනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන්ම දේශීය ජනතාවගේ අවශ්‍යතා සපයන ලද්දේ එවකට ප්‍රචලිතව තිබුණු ඉන්දීය වෙළඳ සමාගම් සහ ව්‍යාපාරිකයින් මගිනි. මුදල් කටයුතු අංශයෙන්ද ඉන්දීය බලපෑම් එකල ප්‍රබල විය. වෙනකක් තබා අප රටේ ස්වදේශීය ව්‍යාපාරිකයින් පවා බොහෝවිට ණයලබාගත්තේ එවැනි ඉන්දීය ව්‍යාපාරිකයින්ගෙනි. එසේ ලංකාවේ සෑම තැනකම එවැනි පොලීකාරයෝ සිටියහ. බායි ඇඳුම ඇඳගත් එවැනි ගිනි පොලීකාරයින් කොළඹ සහ අන් ප්‍රධාන නගරවලද සුලභ දර්ශණයක් විය. ඔවුන් චෙට්ටියාර් යන ඉන්දීය වචනයෙන් බිඳී ආ හෙට්ටියන් වශයෙන් පොදු ජනතාව විසින් හඳුන්වන ලදී. එසේ ගිනි පොලී අයකරමින් උපයාගත් මුදල් ඔව්හු නිදහසේ ඉන්දියාවට රැගෙන ගියහ. ඒ එකල බ්‍රිතාන්‍ය පාලනයෙහි පිළිවෙත බැවිනි.

## දේශීය බැංකු ක්‍රමයක ආරම්භය

වතු ආර්ථිකය යටතේ ඉපැයුණු විශාල මුදල් සම්භාරයන් හැසිරවීම සඳහා සුද්දන්ගේ පිටරට බැංකු ශාඛා අප රටේද ආරම්භ කොට තිබුණි. නමුත් දේශීය ධනයට හා ධනපති පන්තියට එම බැංකු සමග ගනුදෙනු කිරීමේ ඉඩකඩ ඉතා සීමාසහිත වීය. මේ අඩුපාඩුව පිරවීමට ඉන්දියාවේ එවකට ගොඩනැගී තිබුණු ඉන්දීය බැංකු ක්‍රමයක් ලංකාවේ සැකසීමට පවා අර චෙට්ටියාර්ලා යුහුසුළු වූහ. මේ අනුව නාටු කොට්ටේ චෙට්ටියාර් ආදී නම්වලින් ප්‍රචලිතව පැවති මේවාට ලංකාවේ සිටි ඉන්දියානු ගණුදෙනුකරුවන්ගේ අනුග්‍රහය නොමඳව ලැබිණ. මේවායින් රටට ඇතිවන හානිකර බලපෑම් අවබෝධ කරගත්, ඒවන විට වඩා දියුණු මට්ටමකට වර්ධනය වී සිටි අප දේශීය ධනපති පන්තියේ උනන්දුවීම මගින් ලංකාබැංකුව පිහිටුවනු ලැබිණ. එය දේශීය ධනපති පන්තියේ අභිවෘද්ධියට විශාල රුකුලක් වුණි. නමුත් නිදහස ලැබී දශකයක් ගතවන විටත් සුළු ව්‍යාපාරිකයනට සහ සහ සාමාන්‍ය ජනතාවට සිදුවූයේ ගිනි පොලියට සිය ගනුදෙනු සඳහා මුදල් ණයට ගැනීමය.

## මහජන බැංකුව පිහිටුවීම

ලංකා බැංකුව ලොකු ව්‍යාපාරිකයන්ගේ මිස සුළු ව්‍යාපාරිකයන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ මිතුරෙකු නොවීය. සිය මුදල් ගනුදෙනු සහ ණය ලබාගැනීම් ආදිය සඳහා සාමාන්‍ය ජනතා මට්ටමේ බැංකු ක්‍රමයක අවශ්‍යතාව 1960 ගණන් වන විට තදින්ම දැනී තිබිණ. එය සපුරා ගැන්මට රජයේ මැදිහත්වීම යටතේ මහජන බැංකුව නමින් ජනතාවට වඩා ළංවූ බැංකු ජාලයක් පිහිටුවනු ලැබීය. මෙය ජනප්‍රිය වෙමින් ඉතා ඉක්මනින් මුළු රටේම විහිදිණ. මේ වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් අප රටේ මූල්‍ය අංශ තුළ තිබුණු ඉන්දීය බලපෑම් ක්‍රමයෙන් නැතිවී ගියේය.

## තොග වෙළඳාම සහ ආනයන කටයුතු දේශීය කිරීම

1960 ගණන් සහ එයට පසුද අප රටේ පොදු ජන අවශ්‍යතා සැපයුණේ ඉන්දියානුවන් සකසා තිබුණු වෙළඳාම් සහ ආනයන කටයුතු ඔස්සේය. ආහාර ද්‍රව්‍ය, රෙදිපිළි ආදිය සහ අනෙක් බොහෝ පාරිභෝගික ද්‍රව්‍ය සඳහා තිබුණු ව්‍යාපාරික ඒකකයන් සියල්ලම පාහේ එකල සුප්‍රකට ඉන්දියානු සමාගම් වූහ. 1960 ගණන් වල සිට රටේ වාණිජමය කටයුතු වඩාත් දේශීය පැත්තට හරවමින් එකල බලයේ සිටි සිරිමා බණ්ඩාරනායක රජය පෙරදැරි වී කටයුතු කළේය. රාජ්‍ය අංශය ආනයන අපනයන අංශවල කටයුතුවල යෙදීම මගින් ඒවා නියම වශයෙන්ම දේශීයත්වයක් ගත්තේය. එදා පිහිටවූ සමූපකාර තොග වෙළඳ සංස්ථාව රාජ්‍ය වෙළඳ සංස්ථාව මෙයට නිදසුන් වෙති.
අප වැවිලි කර්මාන්ත නිෂ්පාදන හා අපනයනයද පෙර පරිදි මේ වනවිටත් කෙරුණේ විශාල බ්‍රිතාන්‍ය හෝ බටහිර සමාගම් මගිනි. මේ අංශද ක්‍රමයෙන් රාජ්‍ය ආයතන බවට ඊළඟ දශක දෙකේදී හරවාගනිමින් යම් ප්‍රමාණයකට නිදහස් දේශීය ආර්ථිකයකට පදනම ආරම්භ කිරීමට අප රජයන්ට හැකිවීය. මෙසේ බටහිර මෙන්ම ඉන්දියානු ආධිපත්‍යයද තරමකට හෝ බිඳ දැමීමට අපට හැකිකම තිබුණි.

## රටවල් දෙකටම බලපෑ වැදගත් ප්‍රශ්න දෙකක්

1960 ගණන් වන විට දෙරටම නිදහස් රාජ්‍ය වශයෙන් වසර දහයක් පහළොවක් ගතකොට තිබුණි. නිදහස ලැබීමට පෙර සිට ආරම්භ වූ මේ ප්‍රශ්න ඒ වනවිට ක්‍රමයෙන් උග්‍ර වෙමින් පැවතුණි. ඉන් පළමුවැන්න නම් ශ්‍රීලංකාවේ ඒ වනවිට සිටි ඉන්දියානු සම්භවයෙන් පැවත එන මිලියනයක පමණ ජනතාව පිළිබඳ ප්‍රශ්නයයි. දෙවැන්න වූයේ දෙරටේ නිල මුහුදු සීමාවන් නොපැහැදිලිවීම නිසා දෙරට අතර මුහුදේ කොයි පැත්තට අයිතිදැයි තීරණය කිරීමට උගහට වූ කච්චතීව් වැනි දූපත්වල නියම අයිතිය, එනම්, එය ලංකාවට ද ඉන්දියාවටද යන ගැටළුවයි.

හැට ගණන්වල සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රීලංකාවේ අගමැති වන විට ඉන්දීය අගමැතිව සිටියේ ලාල් බහාදූර් ශාස්ත්‍රී මහතාය. දෙරට අතර සුහදව පැවති දීර්ඝ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් අර මිලියනයක පමණ ජනකායෙන් පන් ලක්ෂ විසිපන්දහසක් පමණ වූ ලංකා පුරවැසි පනත යටතේ සුදුසුකම් නොලද ඒ පිරිසෙන් වැඩි කොටස ඉන්දියාව බාරගන්නට එකඟවිය. තුන් ලක්ෂයකට ලාංකික පුරවැසිකම ලැබුණි. 1,75,000 ක්වූ ඉතිරි ජනයාගේ අයිතිවාසිකම් ආදිය විමසා බලා ක්‍රමයෙන් පුරවැසිකම දීමටද තීරණය විය. 1964 දී අත්සන් තැබූ සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම එයයි.

ඊට වසර දහයකට පසු කච්චතීව් දූපතේ අයිතිය ගැන මතභේදයක් පැන නැගුණෙන් ඒ ගැන බණ්ඩාරනායක මැතිනිය හා එවක ඉන්දීය අගමැතිණිය ශ්‍රීමතී ඉන්දිරා ගාන්ධි මැතිනිය අතර 1974 දී සාකච්ඡා ඇතිවීය. එම දූපත් පිළිබඳවද තීරණ ගැනීමටද කටයුතු ඇරඹිණ. මේ සඳහා සිතියම් සැකැසීමේ විශේෂඥයෝ දෙරටින්ම සහභාගි වූහ. ජාත්‍යන්තර නීති අනුව දෙරටේ මුහුදු සීමාවන් මායිම් සම්මත කරගැනීමෙන් පසුව ඒ ඒ දූපත් කාට අයිති වන්නේ දැයි නියමාකාරයෙන් පිළිගැන්මට සිදුවිය. සම්මුතියකට අත්සන් තැබිණ. කච්චතීව් ලංකාවට හිමිවිය. එදා සිරිමාවෝ වැනි ජාති හිතෛෂී නායිකාවන් දුරදිග බලා ඉටුකළ එම ගිවිසුම් නොතිබෙන්නට එයට පසු අසූගණන්වල ඇරඹි කොටි ත්‍රස්තවාදයට මුල පැවති නොපැහැදිලි භාවයන් මොන තරම් රුකුල් වන්නට තිබුණේදැයි මෙනෙහිකර බලන්න.

## ඉන්දියාව සමග නව සබඳතා

මෑතකදී ශ්‍රීලංකා රජය ඉන්දියාව සමග නව සබඳතා ගොඩනගා ගැනීමට අදහස් කරන බව පළවිණ. මේවා හොඳ ආර්ථික පදනම් ගොඩ නගාගෙන දෙරටේ ඉදිරි ගමනකට තුඩුදීමේ අදහසකින් කෙරුණකි. පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්දියාවට නිල ගමනක් ගොස් අගමැති මන්මෝහන් සිං සමග සාකච්ඡා ආදිය පැවැත්වීමට යෙදී තිබුණි. මෙය ආරංචි වුණා පමණි අප මාධ්‍යවේදීහුද, වෙබ් අඩවි සහ බ්ලොග් කාරයෝද කෑගසන්නට වූහ. රට ඉන්දියාවට විකුණන්නට යන ප්‍රයත්නයක් වශයෙන් පවා මෙය අර්ථ කථනය කෙරිණ. එහෙත් ඇත්ත තත්වය කුමක්ද?

ලංකා ජනාධිපතිවරයා ඒ ගමන ගියේ ඉතා ප්‍රබල පදනමක සිටය. වසර 30 ක ත්‍රස්ත ව්‍යසනය අභිබවා ජනපති තරඟය මහ ඉහළින් දිනා එයට පසු 2/3 ක පමණ ඡන්දය ගෙන නව ප්‍රබල රජයක් පාර්ලිමේන්තු මැතිවරණයෙන් පිහිටුවා ගිය ගමනකි. එතුමාගේ එම ජයග්‍රහණයත්, ප්‍රබලතාවත් හඳුනාගෙන ඉන්දියානු නායකයෝ ඊට සරිලන සේ පිළිගත්හ. සැලකූහ. හොර රහසේ ආර්ථික ගිවිසුම් අත්සන්කරනවායයි අවලාද නැගුවද එවැනි ගිවිසුම් ගැන දැනගන්නටද නැත. ඉදිරියේදී වඩා හොඳ පදනමක සිට ආර්ථික කටයුතු මෙහෙයවීම ගැනනම් සාකච්ඡාකොට තිබුණි.

ඉදිරියේදී සවිස්තරව මේවා ගැන දැනගන්නට හැකිවනු ඇත. අප දෙරටටම සුබ අනාගතයක් ඇතිකරලීමට සමත්වන ඉදිරිගමනක් මෙයින් ඇරඹෙනු ඇතැයි සිතමි.

**වකුල ගුණපාල**
Ilford Essex UK

